

# අවදි වනු මා පෙම්බර දේශය

**කාලාග්නි - ජගත් ජේ. එදිරිසිංහ**
**සරසවි ප්‍රකාශන**
**පිටු 182**

''නිද්‍රාගත සමාජයක හුදෙකලා අරගලකරුවෙකුට පැවැත්මක් තිබිය හැකිද? සමස්තය ගංදියේ ගසාගෙන යද්දී උඩුගං බලා පිහිනන්නට වෙර දරන මිනිසුන්ගේ කතාවයි මේ''.

සමාජ දේශපාලන ප්‍රස්තුතයන් විෂය කරගත් බොහෝ නවකතා අද සිංහල සාහිත්‍යයේ එමටය. එත් බොහෝ කෘතීන්වල තේමාව වන්නේ හැත්තෑ එක නැතහොත් අසූ අට - අසූ නමය අවදියේ තරුණ අරගලයයි. එසේ නැතිනම් එතෙර මෙතෙර සමාජ අසාධාරණයට ලිංගික සූරාකෑම්වලට බඳුන්වන කාන්තාවන්ගේ දුක් විලාපයයි. මෙම සුලබ ආරෙන් ඔබ්බට ගොස් කලින වූ ද කම්පනීය වූ ද නැවුම් වූ ද තේමාවක් සහිත පොතක් පසුගිය දා මට කියවන්නට ලැබිණ. ජගත් ජේ එදිරිසිංහ විසින් රචිත කාලාග්නි නවකතාව කියවා හමාර වනතුරු පසෙක තබන්නට සිත් නොදෙන ඉතා ළෙන්ගතු කෘතියක් ලෙස හඳුන්වා දෙන්නට මම සතුටු වෙමි. එසේ වන්නේ එහි

**"නිද්‍රාගත සමාජයක හුදෙකලා අරගලකරුවෙකුට පැවැත්මක් තිබිය හැකිද? සමස්තය ගංදියේ ගසාගෙන යද්දී උඩුගං බලා පිහිනන්නට වෙර දරන මිනිසුන්ගේ කතාවයි මේ".**

අන්තර්ගතය මිහිරි මී පැණි බිඳුවක් සේ රස බේරන නිසා නොවේ. හද මඬල තිගස්වා දෙනෙත් හැර අවට බලන්නට බුද්ධිමත් පාඨකයා යොමුකරන්නා වූ හිරු රැස් දහරක් එතුළින් විහිදෙන බැවිනි.

විරෝධාකල්ප මතධාරී ප්‍රතිභාන්විත තරුණ සිනමාවේදී විදුල සහ මෙම හිතුවක්කාර නිර්මාණකාරයා ගැන නිසි ලෙස වටහාගත්, හැකියාවෙන් පිරිපුන්

**<u>'වැඩක් නෑ සාමා.......... අවස්ථාවාදියෙක් වෙලා පරඬැලක් වගේ නොගිලී පාවෙවී ඉන්නවට වඩා ප්‍රතිපත්ති බෙල්ලෙ එල්ලගෙන ගිලෙන්න මම කැමතියි.....'.</u>**

සුරූපී රංගන ශිල්පිනිය නිරාශා යන සුසංයෝගය සමගින් සිය කෘතියට ප්‍රවේගකාරී ප්‍රවිෂ්ටයක් ලබා දෙන කතුවරයා එම උණුසුම ඔස්සේ පාඨකයා තුළ කුතුහලක් ජනනය කරයි. ඉන්පසුව අපට හමුවන්නේ විදුල විසින් රචනා කරනු ලබමින් සිටින අලුත්ම තිර පිටපතට ප්‍රබෝධක ආවේගය මුසුකරන මදාරා නම් තවත් තරුණ උපාධිධාරිනියකි. යව්වනයට උරුම, අභියෝගවලට පෙම්බඳින අභිලාෂයන් හඹා යන ඇයත්, ප්‍රබුද්ධ කඩතුරාවෙන් නිරුවත වසා සිටින එක්තරා දූෂිත විශ්ව විද්‍යාල ආචාර්යවරයෙකුගේ කුහක අපවිත්‍ර ක්‍රියා පිළිවෙතත් විසල් ලෝකයක අඳුරු සෙවණැළි ගැන බොහෝ දෑ සඟවයි.

ඇගේම වචන වලින් කීවොත් ''අස්ථිර පදනමක පිහිටි ස්ථිර ලේකම්වරියගේ ප්‍රවේශයක් සමගින් කතුවරයා සිය නවකතාට රැගෙන යන අපේක්ෂිත ඉසව්වෙහි ඉතාම පුළුල් පරාසයක් වාචාත

වෙයි.




රාජ්‍ය සේවයේ ගෞරවණීය මට්ටම ලෙස පිළිගැනෙන පරිපාල ක්ෂේත්‍රය අද බොහෝ සෙයින් බලධාරීන්ගේ අතකොළු බවට පත්වී ඇති අයුරු මෙම නිලධාරීන්ට ඉහළින් පැවරෙන නිර්ලජ්ජිත විධානවලින් අපූරුවට ඉස්මතු වෙයි. මේ තත්වය යටතේ රාජ්‍ය සේවයේ නිලධාරීන්ට පමණක් නොව නිර්මාණකරණයේ නියුතු කලාකරුවන්ට හෝ වෙනත් බුද්ධිමතුන්ට ද ගැලවීමක් නැත. පවතින යථාර්ථයට එබ්බෙන් නිර්මාණ සිහිනයේම කිමිදෙමින් සිටිනා අතිශය සංවේදී අවංක තරුණයකු වූ විදුල ට කටුක යථාර්ථය පැහැදිලිකොට දෙන්නී ඔහුගේ විශ්ව විද්‍යාල යෙහෙළියක වන සමදරා නම් ස්ථිර ලේකම් වරියයි.

''ප්‍රතිපත්ති මතම ජීවත්වෙන එක අමාරුයි කියලා තාමත් තේරෙන්නෙ නැද්ද විදුලට? ඒ මත්තෙ නැහෙන්ඩ එපා. ඔය හැම ප්‍රතිපත්තියක්ම වෙනස්වන වෙලාවක් එනවා උඹ අහල තියෙනවනෙ හැම දෙයටම මිලක් තිබෙනවා කියලා. අද උඹ මිලියන එකකට

විකුණුනෙ නැතිවුණාට හෙට මිලියන් දෙකකට විකිණෙන්න පුළුවන්. නැතිනම් තුනකට එහෙම වෙච්ච අවස්ථා ඉතිහාසයේ තියෙනවා. ඒවාට හරි වැරදි කියන්නත් බැහැ. හැම දේම සිදුවෙන්නෙ ඒ සිදුවීම සිදුවෙන අවස්ථාවට පසුබිමට අදාලවයි."

''වැඩක් නෑ සාමා.......... අවස්ථාවාදියෙක් වෙලා පරඬැලක් වගේ නොගිලි පාවෙවී ඉන්නවට වඩා ප්‍රතිපත්ති බෙල්ලෙ එල්ලගෙන ගිලෙන්න මම කැමතියි.....".

සමදරා සිනාසුණාය. එය දැඩි කර්කෂ සිනාවක් යයි විදුලට සිතිණ.......''

ඊර්ෂ්‍යාව, ආවේගය, බලලෝභය, අධික මුදල් කෑදරකම සහ මේ සියල්ලද අභිබව යන සදාචාර වශයෙන් පරිහානියට පත් දේශපාලන නායකයන්ගේ බළල් අත් විහිදී අහිංසක පොදු ජනතාවගේ ගෙල මිරිකී යන ආකාරය භයානක සිහිනයක් නොව වත්මන් යථාර්තයයි. බලකාමයෙන් මත්ව ගිය ජනපීඩක පාලකයන්ට හැලියත් එකය. නෑඹිලියත් එකය. අසංග වැනි අහිංසක

සාමාන්‍ය පුරවැසියන් හිසර සූරිය බණ්ඩාර වැනි උගත් දූෂිතයන්, ජනතාව අවදිකවරන නිර්මාණ කරුවන් හෙවත් ජාතික සම්පත් වන විදුල වැනි දක්ෂයන් මෙවන් තිරශ්චීන පාලන තන්ත්‍රයක ගොදුරු බවට පත් වෙද්දී සමස්ත ජනතාව වැඩී සිටින්නේ මුළාවකය. නැතිනම් නිද්‍රාවකය.

කුතුහලය, විස්මය, දයානුකම්පාව, කෝපය වන විවිධ සංවේදී හැඟුම් වහනය වන කාලාග්නි නවකතාවේ පිටුවෙන් පිටුව දිගහැර සිද්ධි දාමය හෙළිදරව්කොට එය කියවන්නාගේ සැබෑ රසාස්වාදය අසුරා දමන්නට මම රිසි නොවෙමි. ජගත් ජේ. එදිරිසිංහ කතුවරයා සිය තේමාව කුළුන්වනු වස් යොදාගනු ලබන සරල නිරවුල් බස් වහර නිසා කියවීමේ රුචිය අතින් මෙම කෘතිය ඉහළ මට්ටමක පවතී. වියවුල් සහගත දේශපාලන පසුබිමක බුද්ධිමත් සහ විරෝධාකල්ප සහිත කලාකරුවන් මුහුණ දුන් අනාරක්ෂිත තත්වය ගැන මෙතරම් සංවේදී වන්නට ජගත්ට සෑම අතින්ම සුදුසුකම් ලබා ඇත්තෙකි. ඔහු අද දක්ෂ ජනමාධ්‍යවේදියෙකු ලෙසින් ක්‍රියාකාරීව සිටින බැවිනි.

ඕස්ට්‍රේලියාවේ ජීවත් වෙමින්, ප්‍රජා සේවයට කැපවුණු ජගත් ජේ එදිරිසිංහ නම් වූ මේ ප්‍රවීණ සාහිත්‍යකරුවා වෙනුවෙන් අප කළයුතු ගෞරවනීය යුතුකමක් ලෙසින් විශේෂයෙන්ම මෙරට ජීවත් වන කලා රසික සෑම දෙනාම මෙම නවකතාව මිලදී ගැනීම, කියවීම සහ තමන් එය රසවිඳි ආකාරය ගැන වදන් කිහිපයක් හෝ ලියා ඔහු වෙත යැවීම වටනේ යැයි මම සිතමි. එය ඔහුට පමණක් නොව මුදල් ඉපයීම මුල්කොට ගෙන නොව යහපත් සමාජයක් බිහිකිරීම සඳහා ඇප කැප ව සියලු නිර්මාණකරුවන් වෙනුවෙන් කරන උපහාරයක් වන්නේය.